# ස.ණ.ස. පුවත් කොළඹින්

coop

2019 - පෙබරවාරි - දෙවන කලාපය

දායකත්වය රු 15/-


03 පිටුව..

**30 වන සංවත්සරය කහටපිටිය සණස සමිතියේ**

අජන්ත හේරත්
කහටපිටිය සණස වාර්තාකරු

03 පිටුව..



**සංවත්සර සැමරුම**

බී.ඒ. ශ්‍රියානිමාලා

04 පිටුව..



**විනෝද චාරිකාව**

යූ.ඩී.එස්. වීරසිංහ

# සමුපකාර අරමුදල නිලධාරීන්ගේ බුදලයක්ද?

**සණස නායක සමුපකාර ප්‍රසාදිනි ඩැනිසන් වීරසූරිය**

2012 සිට වසර 8 ක් තුල සමුපකාර අරමුදලින් 4%, 5%, හා 8% පොලියට පහත දක්වන පරිදි ලක්ෂ 3593ක් දී ඇත වාරික 60 කින් ගෙවීමට දී ඇත්තේ විවිධසේවා සමිති 15කට ලක්ෂ 1960කි. ග්‍රාමීය බැංකු 3 කට ලක්ෂ 225කි. ආරෝග්‍යශාලා සමිතියට ලක්ෂ 200කි. ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සමිතියට ලක්ෂ 50කි. පළාත් ව්‍යාපාර සංවර්ධන සමිතියට ලක්ෂ 350ක්. ගම්පහ සණස සමිති 10 කට ලක්ෂ 448කි. කොළඹ සමුපකාර සංවර්ධන නිලධාරීන්ගේ සණස ට ලක්ෂ 100 කි. සාමාන්‍යයෙන් මෙම අරමුදලට සණස සමිතිවල දායකත්වය 45%ක් පමණ වේ. ඇමතිතුමා සැලකිල්ල දක්වන ගම්පහ සමිතිවලට ත් කොමසාරිස්තුමා ලෙන්ගතු සිය නිලධාරීන්ගේ හා හිතවත් සමිතිවලටත්, මෙසේ ණය දී ඇති බව පෙනී යනවා මිස සාධාරණය කළ හැකි නිර්නායක මත ණය දී ඇති බවක් නම් තහවුරු වන්නේ නැත. මුදල් රැස්කර දෙන සමිති එකී වියදම් දැරීම් හා ණය දීම් පිළිබදව දැනුවත් වීමේ වැදගත්කමක් සලකා නැත. සමිතියක නම් සාමාජිකයාට සියල්ල විනිවිදව දැකිය යුතු බව ඔවුන් දරන මතයයි.

බස්නාහිර පළාතේ සමුපකාර අරමුදලේ පස් වසරක වියදම් තොරතුරු පහත දක්වන්නේ ඒ පිළිබදව විමසිලිමත්ව වීමටය. වියදම සාධාරණයැයි නිශ්චය කරන්නේනම්, අරමුදලේ දායකත්වය තව තවත් වැඩිකිරීම යෝග්‍ය වන අතර, සාධාරණය ඉටුනොවේ නම් කළ යුත්තේ අතිරික්තය අවම වන පරිදි වැඩි ප්‍රතිලාභ සාමාජිකයාට ලබාදීමය. මෙම වියදම් වාර්තා වලින් අපට කියාපාන්නේ අරමුදලට දායකවීම අවම කළ යුතු බවය. මේ සදහා නිසි උපදෙස් හා මගපෙන්වීම් මගෙන් විමසා ලබාගත හැකිය.

| කාරණය | මුදල රුපියල් | මුලු වියදමින් ප්‍රතිශතයක් |
|---|---|---|
| අධ්‍යාපන සදහා | 10,443,360 | 21.4% |
| පරිගණක පුහුණු | 2,028,200 | 4.2% |
| සංග්‍රහ | 1,378,903 | 2.8% |
| දිස්ත්‍රික් මණ්ඩල වැටුප් | 5,179,720 | 10.6% |
| විදේශ ගමන් | 8,899,019 | 18.2% |
| නිලධාරීන් අභිප්‍රේරණ | 211,400 | 0.4% |
| විවිධ | 3,576,522 | 7.3% |
| විශ්‍රාම වැටුප් ඒකකය | 12,123,655 | 24.9% |
| පරිපාලන | 424,957 | 0.9% |
| සමාලෝචන මණ්ඩල දීමනා | 225,000 | 0.5% |
| සමුපකාර ව්‍යාපෘති වැය | 3,216,391 | 6.6% |
| ස්ථාවර වත්කම් (සමු.විද්‍යාල) | 1,074,576 | 2.2% |
| **මුලු වියදම** | **48,781,703** | **100%** |

මෙම කාලයතුල ඉන්දුනිසියාව, ඊජිප්තුව හා චීනයට ගොස් ඇති මැති ඇමතිවරුන්ගේ වියදම රුපියල් ලක්ෂ 41ක් ඉක්මවා ඇත. දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ ඉන්දියාව හා තායිලන්ත ගමන් සදහා දරා ඇති මුදල රුපියල් ලක්ෂ 15 ඉක්මවයි. බස්නාහිර පළාතේ අධ්‍යාපන පුහුණු මධ්‍යස්ථානයක් පිහිටුවීම සදහා මැලේසියාවේ සමුපකාර විද්‍යාලය සමග අවබෝධතා ගිවිසුමකට එළඹීම සදහා දරා ඇති වියදම රුපියල් 781,000 කි. එවැනි පුහුණු ආයතනයක් ඇත්දැයි විපරම් කර විමසා බැලිය යුතුව තිබේ.

07 පිටුවට...

# උපහාරයෙන් පිදුම් ලබයි



හෝමාගම කලාපයේ සණස සමිති එකමුතුවෙන් කොළඹ දිස්ත්‍රික් සණස සංගමයේ ගරු සභාපති සමුපකාර ප්‍රසාදිනී ඩැනිසන් වීරසූරිය මහතා සමුපකාර ව්‍යාපාරය වෙනුවෙන් සිදුකල සේවය සදහා උපහාර දැක්වීමේ උළෙලක් පසුගියදා ගලවිලවත්ත උතුර සමිතියේදී පවත්වන ලදී.

07 පිටුවට...

# එක්දින චාරිකාව ගියදා

දියගම සණස සමිතියේ වාර්ෂික එක්දින වන්දනා චාරිකාව පසුගියදා මහනුවර දළදා මාලිගාව, අම්බුළුවාව, කොත්මලේ ජලාශය හා කොත්මලේ මහවැලි සෑය ආදී ස්ථාන වෙත යන ලදී.

සණස සමිතියේ වාර්ෂිකව සංවිධානය කරනු ලබන තෙදින චාරිකාවට සහභාගි නොවූ සාමාජික සාමාජිකාවන් වෙනුවෙන් එක්දින වන්දනා චාරිකාව සංවිධානය කරනු ලැබිය. සණස සමිති සාමාජික සාමාජිකාවන් ඔවුන්ගේ පවුල්වල සාමාජික සාමාජිකාවන් මෙම එක්දින චාරිකාවට එක්වූහ.



**චමිලා ජයතුංග - දියගම සණස ලේකම්**

# නත්තල් බැති ගී ගායනය



රාවතාවත්ත බටහිර සණස සමිතියේ කාන්තා කමිටුවේ මෙහෙයවීමෙන් සමනල ළමා සමාජයේ දුව දරුවන් සහ සණස සමිතියේ වැඩිහිටියන් සිව්වන වරටත් පැවැත්වූ නත්තල් බැති ගි ගායනය පසුගියදා ඉතා සාර්ථක අයුරින් පැවැත්විය.

**සුවිනීතා පෙරේරා - කාන්තාකමිටු සභාපතිනි**

# ශිෂ්‍යත්ව පිරිනැමීම

දියගම සණස සමිතියේ හිටපු භාණ්ඩාගාරික දැයෙන් සමුගත් ඒ.ඩී.එස්. රත්නසිරි මහතා නමින් පවුලේ ඥාතීන්, ළමුන් තිදෙනෙකු සඳහා එක් අයෙකුට රු 3,650/- බැගින් පිරිනැමූ ශිෂ්‍යත්ව මුදල් ප්‍රදානය පසුගියදා සිදුකෙරිනි. ජේ.කේ. ධනංජය දේශාන්, පී. සඳුනි දිල්ෂානි, පී. චතුරි මධුෂා ශිෂ්‍යත්ව ලාභීහු විය.

**චමිලා ජයතුංග - දියගම සණස ලේකම්**



# නිදහස සත්‍යයේ අවකාශයයි



"සමාජය විසින් පුද්ගලයා මත පටවන චින්තනය තුළ හිර වී සිටින තුරු සිත නිදහස් නැතැයි," මතයක් පවතී. මෙම මතය විමසා බැලීමට, දේශපාලන නිදහස 1948 පෙබරවාරි මස 04 වෙනිදා ලබාගත් සිරිලක වැසියන් අවදියෙන් සිටිද්දැයි දෙවරක් සිතා බැලිය යුතුය.

මහාමාන්‍ය ඩී.එස්. සේනානායක මැතිතුමාගේ නායකත්වයෙන් මහා බ්‍රිතාන්‍ය පාලයෙන් අප රට මුදවා ගනිමින්, දේශීය සංස්කෘතියක් කරා පියමං කිරීමට ගත් උත්සාහය, වසර හැත්තෑඑකක් පිරෙන මොහොතේ පැසසිය යුත්තේ ලාංකිකයින්ගේ වගකීමක් ලෙසිනි.

එදා මෙදා තුර ශ්‍රී ලාංකික ජනතාව "නිදහස" යැයි සිතූ ජීවිතයේ සැබෑ නිදහස හි අරුත පැහැදිලි කර ගත් ස්වාභාවයක් ප්‍රායෝගිකව දැකිය නොහැක. "නිදහස" යන වදනෙහි අර්ථ රාශියකි. දුප්පත්කමින් නිදහස, නුගත්කමින් නිදහස, දේශපාලන නිදහස, කථා කිරීමේ නිදහස, ලිවීමේ නිදහස, ඒවායින් කීපයකි. කෙටියෙන් මෙහි අරුත පැවසීම වන්නේ, "විෂම තත්ත්ව වලින් මිදීම" නිදහස යන්නෙන් අදහස් කළ හැකි බවයි. හැම කෙනෙක්ම සිතන්නේ තමා නිදහස් පුද්ගලයෙකු කියායි එහෙත් මානසිකව හැම කෙනෙක්ම බැඳී සිටිනවා නොදැනුවත්වම ක්‍රියාවන් කෙරෙහි.

පුද්ගල නිදහස සමාජ පාලනයට ප්‍රතිවිරුද්ධයි. සමාජයට අවශ්‍ය වන්නේ, සමාජ නීති රීති වලට, සංස්කෘතියෙන්, ආගමෙන්, ජනවාර්ගිකත්වයෙන් පුද්ගලයා බැඳ තබා ගැනීමටයි. මිනිසා නිදහස් වීමට නම් ඒ බැමි බිඳ දමා ස්වාධීනව නැගී සිටිය යුතුයි. එහෙත් පුද්ගලයාට නිදහස දීමට අධිකාරිය බියයි. මන්ද අධිකාරියට තර්ජනයක් වේවි යන අදහස ඇතිවීමෙන් පුද්ගල නිදහස මෑත කාලයේ ඇති වූ අවශ්‍යතාවයකි. අතීතයෙහි ගෝත්‍රීය සමාජය තුළ සමුහයා වශයෙන් එක්ව ජීවත්වීමෙන් පුද්ගල නිදහස යන සංකල්පය ඇති නොවුනි. ගෝත්‍රීය නායකයාට අවනතව, අන්‍යෝන්‍ය සහයෝගයෙන් සිටීම නිසා, වෙන් වී නිදහසේ ඉදිරියට යාමට ඉඩක් නොතිබිනි.

මානව ප්‍රගතිය ගැන, පුද්ගල ස්වාධීනත්වයට ඉඩ ලැබීමෙන් පසු කථා කිරීමට අවස්ථාව සැලසුනි. එසේ වුවත්, සමාජ අධිකාරිය ඊට විරුද්ධ වු බවට සාධකයකි. සොක්‍රටීස්ගේ ජීවන පුවත, යමෙකු අර්ථවත් ජීවන හෝ සමාජ දර්ශනයක් ඉදිරිපත් කළ විට, පවත්නා තත්ත්වයට වඩා එය ආර්ථවත් නම්, අනාගත පරපුර එය පිළිගැනීමෙන් අර්ථ ගවේෂකයෙක් නොවන්නේද? එසේම අදහන ආගම මනුෂ වර්ගයාගේ ප්‍රගතියට දායක වීමෙන්, ශිෂ්ඨාචාරයෙන් පෙර ගමනක් යෑමට ඉඩ ප්‍රස්ථාව සැලසුනි. පැවති සංස්කෘතිය සමාජීය ආර්ථිකය මේ නිසාම පැති කිහිපයකින් නවීකරණය වී වර්ධනයක් ලැබූ බව පෙනේ. එහෙත් පුරාණ ආගමික ග්‍රන්ථ තුල හිරවී සිටීමෙන්, ආධ්‍යාත්මික නිදහස සොයා ගැනීමට, අර්ථවත් වීමට ඉඩ ප්‍රස්ථාවක් නොමැත.

ස්වාධීන දැකුමක් ඇති කර ගැනීමට සමාජය විසින් අප තුළ තත්ත්වාරෝපණය කරන ලද චින්තනයෙන් සිත මුදවා ගතයුතු වේ. තම ආත්මය සමාජයට පාවා නොදී, අවශ්‍ය විචාරයට යොමු වීමෙන් වර්තමාන දේශපාලකයාගේ ජනහිතකාමී සුන්දර වචන තුළ ගැබ්ව ඇති බලකාමය හා ජනතාව රැවටීමට ගන්නා තැන නිශ්ප්‍රභා කිරීමට හැකිවිය යුතුය. ප්‍රශ්න කළ යුතුයි. සත්‍යද අසත්‍යදැයි විමසා සිටිය යුතුය. බුද්ධිය අවධිකිරීමට ප්‍රශ්න කිරීම වැදගත් වේ. පුද්ගල නිදහස යැයි අපි සිතා සිටින වපසරිය වැරදිය. මට අවශ්‍ය හැමදේම කිරීමට අවකාශ කොහෙත්ම නැත.

තමාගේ සත්‍ය ස්වාභාවය කරා වර්ධනය වීමටත්, තම සත්‍ය ස්වාභාවය අනුව ජීවත් වීමටත්, අවශ්‍ය වන අවකාශය, නිදහස යැයි තීරණය කළ හැක. සිත විසින් වසාගෙන සිටි තත්ත්වය විවෘත වීමෙන් පරම නිදහස ලැබූ වෙකැයි සැනසිය හැක. එහෙත්, සිතට ඒ ගැන්ම ගැනීමට පවතින සමාජය ඔබට, මට ඉඩදේද? සමුපකාරික වු ඔබට අනෙක් අයට වඩා අවකාශය විවෘතව "නිදහස" කරා යන්නට මග සළසා ඇත.

# ගෘහස්ථ හිංසනය තුරන් කරමු.



මෙවර පැවැත්වෙන උළෙලේදී, සමිති අනුව නියෝජනය ප්‍රමාණවත් නොවන බව මෙයට අධ්‍යක්ෂක මණ්ඩලයේ අවධානය යොමු කරනා ලෙසත්, නායක්තවය පිළිබඳව දැනුමක් ඇතිකරගෙන ඉදිරියට ආ යුතු බව, නායකත්වයට වඩාත්ම යෝග්‍ය අය පත්කරගනු ඇතැයි විශ්වාස කරනා බව, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී පද්මිණිලියන ආරච්චි මහත්මිය 35 වන සංවත්සර සභාවේ කැදවීමේ නිවේදනය ඉදිරිපත් කරමින් පවසන ලදී.

මධ්‍යම කාන්තා කමිටු ගරු සභාපතිනි ජයන්ති නවරත්න මෙනෙවිය විසින් ගරු සභාපති ඩැනිසන් වීරසුරිය මැතිතුමා සෑම වසරකම පැමිණි බවත්, උප සභාපතිතුමා සහ සාමාන්‍යාධිකාරීතුමාවත් , ආරාධිත දේශණය සදහා පැමිණි ලෝක සෞඛ්‍යය සංවිධානයේ ශාලිකා ගුණවර්ධන මැතිණිය ඇතුලුව, අධ්‍යක්ෂ මණ්ඩලයත්, කාර්ය මණ්ඩලයත්, පැමිණ සිටින නායිකාවන් සියලු දෙනා ගෞරවයෙන් පිළිගන්නා බව පැවසුවාය.

සම ආරම්භක දෙසුම කල උප සභාපති ගරු එම්.ඒ.එස්. පෙරේරා මහත්මා 35 වන සංවත්සරයට සහභාගි වීමට සිටි, ගරු සභාපතිතුමා හංවැල්ල සණස සමිතියේ පරීක්ෂණයකට සහභාගි වන බැවින්, එතුමා නොපැමිණෙන බව, විශාල කාර්යයක් කරනා කාන්තාවන් හැටියට, සංකීර්ණ රටාවක් තුල මෙම කාර්‍ය ඉටුකිරීම ගැන සතුටුවන බව පවසන ලදී. සමාජතලය මත කාන්තාවන් සවිබල ගැන්වීම කල යුතුයි. ආගමානුකූලව, සමතැන ලබාගැනීමට නම්, අත්දැකීම් සහ දැනුවත්වීම් ලබාගත යුතුවේ. කාන්තා කමිටුවට පත්කර ගැනීම, ඉතා අපහසු කාර්යයක් බවත්, හඬක් නැගිය හැකි අය බිහිකල යුතු බවත්, ඉදිරි දශකයේදී, අරමුණක් ඇතිව ගමන්කොට ක්‍රියාත්මක විය යුතු යැයිද පරිණත භාවයෙන් යුත්, කාන්තාවන් කොටසක් බිහි කරමුයැයි, ප්‍රාර්ථනා කලේය.

සාමාන්‍යාධිකාරි තුසිත වීරවර්ධන මහත්මා 35 වන සංවත්සරය වෙනුවෙන් මෙම දේශණය තුලින් අලුත් යමක් දැනගැනීමේ හැකියාවක් ඇති බව, එතුමිය වෘත්තියෙන් වෛද්‍යවරියක් වන බවත් නැෂනල් ප්‍රොපෙෂනල් සෞඛ්‍ය මධ්‍යස්ථානයේ වසර 15ක කාලයක්, ප්‍රජා සේවය, සම්බන්ධයෙන්, අත්දැකීම් ලබා ඇති නාලිකා ගුණවර්ධන මැතිණියගෙන් හරවත් සාරවත් යමක් ලබාදෙන බව පවසන ලදී.

වෛද්‍ය නාලිකා ගුණවර්ධන මැතිණිය කථා කරමින්, ප්‍රජා නායකයින් කණ්ඩායමක් ඇමතීමට ලැබීම ගැන සතුටුවන බව, ගෘහස්ත හිංසනය තුරන් කරමු යන මාතෘකාව තෝරාගත් බව, ගෘහස්ත හිංසනයට මුලින් උදුරා දැමිය හැකිබව පැවසුවාය. මෙය එක්තරා ආකාරයකට ස්ත්‍රී, පුරුෂ සමජභාවය සම්බන්ධ හිංසාවකි. ස්ත්‍රී පුරුෂ භේදය, අනුව කාරනා ක්‍රියාකාරකම් නිසා ඇතිවන හෝ ඇතිවිය හැකි, ශාරීරික මානසික හෝ මුල්‍යමය හානියක් හෝ විදවීමකි. සමාජතාවය වරදවා ගැනීමේ හේතුවෙන්, ශාරීරික ලිංගික මානසික හිංසනයක් සිදුවේ. ගෘහස්ථ යනු, ගෙතුල සිදුවන ක්‍රියාවලියකි. ගෙදර ප්‍රශ්ණ පිටට නොදීම සංස්කෘතික ප්‍රශ්ණයකි.

රජයේ රෝහලක පිහිටුවා ඇති, හිංසාවක් මගින් මුදාගත් අයට මිතුරු පියසකි. හිංසනයට විරුද්ධව සමාජ සම්මතයන් වෙනස් කිරීම, සමාජ තුල ආකල්පමය වෙනසක් ඇතිකිරීම, කාන්තාවනට ගරු කිරීම, මානව හිමි කම්වලට ගරු කිරීම, නිපුනතාවය ලබාදිය හැකි බව එතුමිය පවසන ලදී. කඩුවෙල කලාපයේ ඉන්ද්‍රානි මිය අදහස් දක්වමින් මධ්‍යම කාන්තා කමිටුව මගින් මාස්පතා කල වැඩසටහන් වලින් මහත් ප්‍රයෝජනයක් ලද බවත්, තමන් දන්නාදේ අන් අයට දැනුම ලබාදිය හැකි බව පැවසුවාය. මෙතෙක් පැවැත්වූ වැඩ සටහන් තුලින් ප්‍රදර්ශනයක් පැවැත්විය යුතු බව පවසන ලදී.

උප සභාපති එම්.ඒ.එස්. පෙරේරා මහත්මාගේ ස්තුතියෙන් සභාව නිමාවිය.

**ප්‍රේමලතා වණිගසේකර**
**හෝමාගම කලාපයේ අධ්‍යක්ෂිකා, මධ්‍යම කාන්තා කමිටුවේ ගරු ලේකම්**

# ගලවිලවත්ත උතුර සණස සමිතියේ දානමය පිංකම

ගලවිලවත්ත උතුර සණස සමිතිය මගින් සංවිධානය කරන ලද විපස්සනා භාවනා මධ්‍යස්ථානයේ ගරුතර නාහිමි ප්‍රා ඇහැලියගොඩ පුණ්ණජී ස්වාමින් වහන්සේගේ ප්‍රමුඛත්වයෙන්, ස්වාමින් වහන්සේලා දහනමක් විෂයෙහි සියලුම සාමාජික සාමාජිකාවන්ගේ, සහභාගිත්ව යෙන්, සංඝගත දක්ෂිණාවක් පිරිනමන ලදී. එයින් ලද කුසල්, සමිතියේ මියගිය අය වෙනුවෙන්ද රට දැය වෙනුවෙන් දිවිපිදු රණවිරුවන්ටද, අනුමෝදන් කල අතර, සමිතියේ නිලදරුවන් ඇතුලු සාමාජික සාමාජිකාවන්ටද, සියලුම රට වැසියන්ටද, අනුමෝදන් කරන ලදී.

**ප්‍රේමලතා වණිගසේකර**
**ගලවිලවත්ත උතුර සණස සමිතියේ කාන්තා කමිටු සභාපතිනි**

## ස.ණ.ස. පුවත් කොළඹින්

☆ **අධීක්ෂණය**
ඩී. වීරසුරිය
තුසිත් කුමාර වීරවර්ධන

☆ **ප්‍රකාශන කමිටුව**
කේ. ඩී. පතිරත්න
හේමසිරි බෙනරගම
සුනිල් අබේසුන්දර
එම්.රොහාන් ජේ. පෙරේරා
එම්.ඩී. ජිනදාස

☆ **විධායක සහාය**
නාලක ජයසුරිය

☆ **පරිගණක අක්ෂර හා සැලසුම**
කේ. ඒ. සම්පත් ප්‍රසංග

**කොළඹ දිස්ත්‍රික් ස.ණ.ස. සංගමය**
220/1, හයිලෙවල් පාර, මහරගම.
දු.ක. 0112 851213, 0112 848801, 0114 301228
gm@sanasacolombo.lk

# සංවත්සර සැමරුම

මොරටු කලාපයේ කුඩුවාමුල්ල සණස අනුබද්ධිත ළමා සමිතියේ 2019 වර්ෂයට පත්වූ නිලධාරි මඩුල්ල

| | | |
|---|---|---|
| **ගරු සභාපති** | : | නෙතුම් දේවප්‍රිය |
| **ගරු උපසභාපති** | : | ෂෙවින් |
| **ගරු ලේකම්** | : | උමාෂා |
| **ගරු උපලේකම්** | : | චානුක |
| **ගරු භාණ්ඩාගාරික** | : | හවෝද් |
| **ගරු කාරකසභික** | : | මෙනුරි හංසිකා, ධ්‍යානි නිශාක්‍යා ප්‍රනාන්දු, උමායා, කවීෂා ගිම්හානි, චේතනා ගිම්හාන, බිතුමී දුල්නෙත්, පවීෂා, අමේෂ්, මෙහන්සා රුවිනි, ඉදුවරි හංසිකා |

**කුඩුවාමුල්ල සණස වාර්තාකාරිනිය**
**බී.ඒ. ශ්‍රියානිමාලා**



**කුඩුවාමුල්ල සණස අනුබද්ධිත ළමා සමිතිය විසින් පානදුර මූලික රෝහලේ ජල ෆිල්ටරය අලුත්වැඩියා කර භාරදීම.**

# කහටපිටිය සණස සමිතියේ 30 වන සංවත්සරය

හංවැල්ල කලාපයේ කොස්ගම පර්ෂදය නියෝජනය වන සී.ස. කහටපිටිය සණස සමිතිය අභිමානවත් 30 වන සංවත්සර සැමරුම පසුගියදා කහටපිටිය සණස නිවහනේදී හංවැල්ල කලාප අධ්‍යක්ෂ පී.ඩී. කරුණාරත්න මහතාගේ සහ කොස්ගම පර්ෂද සමිති නිළධාරින්ගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී. තිස් වසරක ගමන් මග තිස් වසරම භාණ්ඩාගාරික ධුරය දැරූ ඩබ්.එල්.සී. අල්විස් මහතා විසින් ගෙනහැර දක්විය. සෙනෙහස් ළමා සමිති දරු දැරියන්ගේ අලංකාර නර්තනයන්ගෙන් සංවත්සර මහ සභාව වර්ණවත් විය. ආරාධිත දේශණ සමිතියේ උන්නතිය සදහාත් සාමාජික සාමාජිකාවන්ගේ උද්යෝගය වැඩි කිරීමටත් හේතු වූවා නිසැකය. 2017 වසරේ හොඳම පැමිණිම වෙනුවෙන් සාමාජික සාමාජිකාවන්ට ත්‍යාග පිරිනැමීම ආරාධිත අමුත්තන් අතින් සිදු විය. වසර 25ක් සමිතියට සක්‍රීය දායකත්වය ලබාදුන් සාමාජික අංක 63 දරණ වයලට් රණතුංග සාමාජිකාව සහ සාමාජික අංක 102 දරණ ඩී.ඩී. සෝමලතා සාමාජිකාව මහ සභාවේ ගෞරවයට පාත්‍ර වෙමින් සම්භාවනීය සාමාජික සංසදයට ඇතුලත් වීමේ හිමිකම් සහතික පත්‍ර ලබාගන්නා ලදී. ගරු කලාප අධ්‍යක්ෂක තුමා මුලසුන ගත් සංවත්සර මහා සභාවේදී 31 වන වසර සදහා අභිනව කාරක සභාව සහ විගණන කමිටුව තෝරා පත්කර ගැනීම සිදුකරන ලදී.

| | | |
|---|---|---|
| **ගරු සභාපති** | : | අජන්ත හේරත් |
| **ගරු උපසභාපති** | : | එල්.පී.පී. ක්‍රිශාන්ත |
| **ගරු භාණ්ඩාගාරික** | : | ඩබ්.එල්.සී.ද අල්විස් |
| **ගරු කාරක සභික** | : | සුමනලතා කලටුවාව, ජේ.ඒ. සමන් චාමින්ද, කේ.පී. ලීලාරත්න, කේ.ඩී. දයාවංශ |
| **විගණන කමිටුව** | : | එල්.ඒ.ඩී.එස්. මල්කාන්ති, කේ. ඩබ්ලිව්.සී. මල්කාන්ති, පී.ඒ.පී. පුෂ්පකාන්ති |

**අජන්ත හේරත් - සී.ස. කහටපිටිය සණස වාර්තාකරු**

# ඔබට සුභ උපන්දිනයක්



1963 වර්ෂයේ ආරම්භ කර රාජගිරිය නැගෙනහිර සණස සමිතියේ ආරම්භක සාමාජිකයෙකු වන අතරම සමිතියේ දැනට උපසභාපති ඩික්සන් අත්තනායක මහතාගේ 75 වන ජන්ම දිනය දෙසැම්බර් 06 වන දින බැංකු කාර්යාලයේ දී සමරන ලදී. සමිතියේ සාමාජිකත්වය ලබා වසර 50ක් පිරිම ද විශේෂත්වය විය.

ඔහුගේ ස්වේච්ඡා නායකත්වය පිලිබදව සදහන් කරන්නේ නම් සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලය නියෝජනය කරමින් සුබසාධක කමිටුවේ සභාපති තනතුර හා උපසභාපති තනතුරේ වසර ගණනාවක් සේවය කර ඇත.

දිස්ත්‍රික් සංගමයේ නුගේගොඩ කලාපයේ රාජගිරිය පර්ෂදයේ සභාපති වශයෙන් සණස ව්‍යාපාරයට නායකත්වය දෙමින් නුගේගොඩ කලාප සමිති වලට විශාල සේවයක් කර ඇත. ඔබට සුබ උපන්දිනයක් ප්‍රාර්ථනා කරමි.

**සුනිල් අබේසුන්දර නුගේගොඩ කලාප අධ්‍යක්ෂක**

# පෙරට යන්න අත දෙන්න

| | |
|---|---|
| දුප්පත් මිනිසුන් පොහොසත් | කරනා |
| එකමුතු කම හා සෙනෙහස | වඩනා |
| මිතුරන් රැසකුත් එකතු | කරනා |
| පානළුවේ සණසට සුභ | පතනා |
| විස්සයි දහනමය සුභ වසරක් | ලු |
| පත්වුනු නිලධාරි හට හරි වෙනසක් | ලු |
| ඉදිරියට ජයගෙන එන වෙනසක් | ලු |
| සණසට ගමෙන් තව අය ගෙන්නමු | ලු |
| අපේ හිටපු නිලධාරින් වැඩ | කෙරුවා |
| ඒ හැම දෙනාටත් නිරෝගි | වේවා |
| පත්වුනු නව නිලධාරින්ටත් | සුභවේවා |
| මේ වසරේ සණසේ පැතුම් | ඉටුවේවා |
| පානළුවේ ගම හරි | නිසන්සලයි |
| ළමා සමිතිය තව හැඩ | කරලයි |
| කාන්තා කමිටුව තව වැඩසටහන් | කරලයි |
| තරුණ කමිටුව දන්සල් | පවතයි |
| සුභ සාධනයන් පිහිටට | ඇත්තේ |
| ව්‍යවසායකයත් දිරි ණය | ඇත්තේ |
| දුප්පත් මිනිසා ඔසවා | ඇත්තේ |
| පන්සල, පාසල පෙරමුණ | ගත්තේ |
| මේ සැම ඉටුවන සණස | අපේ |
| තැන්පතුවට වැඩි පොලි දෙනවා | අපේ |
| ආවේ නැත්නම් එන්නකෝ සණසට | අපේ |
| පානළුවේ සණසයි ඔබ සැමගේ | අපේ |

**ප්‍රියනි වැලිකන්න - පානළුව සණස ලේකම්**

# නුවණැති ජය

*කවදා හෝ දිනෙක*
*ලොව සුන්දරත්වය ඔබට පෙන්වූ*
*ඔබේ දෙනෙත් ඔබ හැර යනු ඇත.*
*එවිට... ඔබේ සිත .....ගත*
*මිහිරියාවෙන්... අමන්දානන්දයෙන්*
*මුසපත් කළ දෙසවනද*
*ඔබ හැර යනු ඇත.....*
*ගඳ සුවඳ රස රැසකින්*
*සිත.... ගත..... ප්‍රබෝදමත් කළ*
*රස නහර ඉදුරන්*
*ඔබ ලග නැති බව දැනෙනා විට*
*ගත වෙලාගත් ... සිසිල.... උණුහුම*
*කම් සැපයෙන්..... උමතු රාගයෙන්*
*මන්මත් වූ ගත.... නිසල වනු ඇත*
*ලෝකය හැර ගොස්... අඳුර රජයාවි...*
*සරණක් නැතිව.. අසරණ මොහොත*
*උදාවූ කළ ... නිහඬව සිතන්න...*
*කුමක්ද .. මම කව්දැයි*
*විසදුම අඳුර පරයා නැගෙන*
*ආලෝකයයි.. සදාතනික සැපයේ*
*පසුබට නොවන්න... උත්සුක වන්න...*
*එවිට.....*
*නියත ජය... ඔබෙ.. ඔබටම පමණයි.*

**අජන්ත හේරත්**
**සී.ස. කහටපිටිය සණස වාර්තාකරු**

# තෙදින චාරිකාවක්

ගලවිලවත්ත උතුර සණස සමිතිය සංවිධානය කල වසරක් පුරා පැවැත්වෙන, තෙදින චාරිකාවේදී ලංකා පටුන ගෙඩිගේ විහාරය, පොළොන්නරුව, කොටිහඩ පැවැත්වූ ස්ථානය, යන ස්ථාන රාශියක් දැක බලා, වැඳ පුදා ගන්නා ලදී.

**ප්‍රේමලතා වණිගසේකර**
**ගලවිලවත්ත උතුර සණස සමිතියේ කාන්තා කමිටු සභාපතිනි**

# ග්‍රාමීය ආර්ථිකය ණයගැති භාවය සහ කාන්තා හිංසනය.

ග්‍රාමීය ණයගැති භාවය මෙරට පවතින ආර්ථික ගැටළු අතර මුල් තැනක් ගනී. ග්‍රාමීය ආර්ථිකයේ ප්‍රධාන සැපයුම් මාර්ගය කෘෂි කර්මාන්තයයි. සුළු කාර්මාන්ත, සාම්ප්‍රදායික රැකියා, ධීවර කටයුතු, ගෘහ නිෂ්පාදන, දෛනික කුලීවැඩ, වෙනත් ජීවන මාර්ග වශයෙන් සඳහන් කළ හැක. නාගරික ආර්ථිකයේ දක්නට ලැබෙන තරඟකාරී වෙළඳාම, කලු සල්ලි ජවාරම, කුඩු වෙළඳාම ඇතුළු අපචාර විධි ගැමි ආර්ථිකයේ දක්නට නැත. ග්‍රාමීය ආර්ථිකයේ වර්ධනය සඳහා ඇති ප්‍රබල ගැටළුව වන්නේ ප්‍රාග්ධන හිඟකමයි. රටේ පත්වන සෑම ආණ්ඩුවක්ම ගැමි ආර්ථිකය සංවර්ධනය කිරීම සඳහා විශේෂ ව්‍යාපෘති සකස් කර තිබේ. කෘෂිකර්ම ආහාර හා සෞඛ්‍ය ගැටළු ගැමි ආර්ථිකයේ මූලික ප්‍රශ්න බවට පත්වෙයි. අප රටේ ඇති බිම් ප්‍රමාණයෙන් වගා කළ හැකි වන්නේ 40%ක ප්‍රමාණයකි. ඉන් වැඩි කොටසක් වාණිජ වැවිලි සඳහා යටවී ඇත. 1920 - 1930 ගනන්වල පැවති ගොවිජනපද ව්‍යාපාරය, ගල්ඔය සංවර්ධන ව්‍යාපාරය (1952) ග්‍රාමීය ආර්ථිකය නව මගකට යොමු කරන ලදී. 1935 ඩී.එස්. සේනානායක මහතාගේ ඉඩම් සංවර්ධන පනත මගින් තෙත් කලාපීය ගොවීන්ට වියලි කලාපයේ ඉඩම් ලැබුණි. මහවැලි කඩිනම් ව්‍යපාරය යටතේ නව ඉඩම් අක්කර 320,000ක් පමණ අස්වැද්දීමට ලැබීම ගොවියාගේ තවත් ජයග්‍රහණයක් විය. 1948 දී වී සඳහා සහතික මිලක් ලැබුණි. කෘෂි රක්ෂණ ක්‍රමය නිසා ගොවියාට සෙත සැලසුනි. 1988 දී වී බුසල රු 20 බැගින් වී අලෙවි මණ්ඩලය මෙට්රික් ටොන් 105497ක් මිලට ගෙන තිබේ. ගොවීන් සඳහා අස්වැන්න ලැබෙන තෙක් වියදම් කර ගැනීමට අවශ්‍ය මුදල් ලබා ගැනීම අසීරු ප්‍රශ්නයක් විය. ගොවි ජනපද ආශ්‍රිතව බිහිවූ ණය දෙන සමිති වල විකාශනයක් වශයෙන් 1906 දී රාජ්‍ය අනුග්‍රහයෙන් තෙල්දෙණිය පාත දුම්බර ණය ගනුදෙනු සමිතිය පිහිටුවන ලදී. 1911 අංක 7 දරණ සමුපකාර ණය ගණුදෙනු ආඥාපනත සම්මත වීම ග්‍රාමීය ණයගැති භාවයට ලැබුණ තවත් ආශිර්වාදයකි. 1961 දී බැංකු සේවය ගොවියාට තවදුරටත් ලඟාවීමක් වශයෙන් මහජන බැංකුව ආරම්භ විය. සමුපකාර රෙජිස්ට්‍රාර් වරුන් වූ ස්ටොක් ඩේල් (1921) කැම්බල් (1927) මහත්වරු ග්‍රාමීය ණයගැති භාවය දුරු කිරීම සඳහා සමුපකාරය යොදා ගන්නා ලදී. ඉංග්‍රීසි ජාතිය පරිපාලන නිලධාරීන් බොහොමයක් ඉන්දීය ග්‍රාමීන් ව්‍යාපාරය පිළිබඳ ලබාතිබූ දැනුම මීට හේතුවිය. 1930 සමුපකාර කොමසාරිස් ධුරය දැරූ කැල්වට් මහතා ප්‍රකාශ කලේ සමුපකාර ණය දෙන සමිති වලින් ප්‍රාග්ධන රැස්කර ලාභය වර්ධනය කිරීම වෙනුවට මානව සම්පත් සංවර්ධනයට මුල් තැන දියයුතු බවයි.

බැංකු ව්‍යාපාරය තවදුරටත් ගොවි ජනතාවට ලංවීමක් ලෙස 1972 දි ලංකා බැංකුව සිය ශාඛා ගොවිජන සේවා මධ්‍යස්ථාන වල ආරම්භ කරන ලදී. 1987 දී ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය සකස් කරන ලදී. 1972 දී කෘෂි පර්යේෂණ පුහුණු ආයතනය පිහිටුවීය. 1978 පිහිටවූ කෘෂිකර්ම සංවර්ධන අධිකාරිය කෘෂිකර්මයට අදාල සියළුම කරුණු පිළිබද අවසන් තීරණය ගන්නා ආයතනය බවට පත්විය. ඌණ සංවර්ධිත දිස්ත්‍රික් දොළහක් තෝරාගෙන ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධනය ව්‍යාපෘතියක් 1979 දී ආරම්භ කරන ලදී. මෙය ලෝක බැංකුවේ ආධාර ඇතිව කෘෂිකර්මය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල, නෙදර්ලන්ත, නොර්වේ, ස්වීඩනයේ ආධාර ඇතිව කරන ලද සාර්ථක ව්‍යාපෘතියකි. ධීවරයන් සඳහා නව ධීවර වරාය පිහිටුවීම, මිරිදිය මත්ස්‍ය කර්මාන්තය සඳහා බෝකිරීමේ සහ පර්යේෂණ ආයතන පිහිටුවන ලදී. 1979 දී මේ සඳහා පස් අවුරුදු සැලැස්මක් ඇති කරන ලදී. ග්‍රාමීය කර්මාන්ත ක්ෂේත්‍රයේ නිෂ්පාදන සඳහා එල්ලවූ අභියෝගය වූයේ ආනයනික භාණ්ඩ සමග තරඟ වැදීමට සිදු වීමයි. ග්‍රාමීය දැව ආශ්‍රිත කැටයම් කලාව ආරක්ෂා කිරීමේ පියවරක් වශයෙන් හස්ත කර්මාන්ත ගම්මාන පිහිටුවන ලදී. නන්තරන්පොත හස්ත කර්මාන්ත සඳහා වූ පවුල් 40ක් පදිංචි කරනු ලැබීය.

ශ්‍රී ලංකා මහ බැංකුව ව්‍යවාසායකත්වය නගා සිටුවීමට 'ස්වශක්ති' නමින් ණය ක්‍රමයක් ආරම්භ කරන ලදී. ස්වයංරැකියා සඳහා ණය ලබාදීම වාණිජ බැංකු සතුකාර්යයකි. මහ බැංකුව දේශපලනී කරණය වීම අභාග්‍යයකි. 1978න් පසු ගොවි නිලධාරීන්, ජනසවි නියාමකයන්, දිවිරැකුම නියාමකයන්, සමෘධි නිලධාරීන්, නඩත්තු කිරීමට විශාල මුදලක් වැයවේ. අසරණ අයට මුල්‍යාධාර වශයෙන් කෝටි 495 රජය වැයකර තිබේ. ගංවතුර, නියඟය, නායයාම් ආදී අවස්ථාවල ආපදා වශයෙන් බොහෝ මුදල් වැයවේ. මෑතදී ගම් පෙරළිය සහ එන්ටප්‍රයිස් ශ්‍රී ලංකා නමින් විශේෂ ව්‍යාපරික ණයක්‍රම දෙකක් පටන් ගන්නා ලදී. මුදල් ඇමති වරයා මේ සඳහා ලක්ෂයකට ණය නිකුත් කරන ඇති බව ප්‍රකාශ කරයි. ලංකා බැංකු සේවක සංගමයේ ලේකම් පවසන්නේ කිසිදු බැංකුවක් එම බැංකුවේ කොන්දේසි වලට අනුකූලව මිස ණය නොදෙන බවයි. ජ්‍යේෂ්ඨ පුරවැසි ස්ථාවර තැන්පත් සඳහා විශේෂ පොලී අනුපාතයක් ගෙවීම වෙනුවෙන් ලංකා බැංකුවට, ප්‍රදේශීය සංවර්ධන බැංකුවට රජයෙන් රුපියල් මිලියන 20 කට වඩා අයවීමට ඇති බවයි.

ක්ෂුද්‍ර මුල්‍ය ණය දීමේ ආයතන සාමන්‍ය බැංකු ක්‍රම වලට වඩා පහසුවෙන් සහ විශේෂයෙන් ගැමි ජනතාවගේ පහසුව සඳහා මහ බැංකුව හදුන්වා දී තිබේ. ගැමි ජනතාව ණය බරින් මුදවා ගැනීම, ඇපකරුවන්, තැන්පත්, නොමැතිව ඉක්මනින් ණය ගැනීම අරමුණු කරගෙන පිහිටුවා ඇත. බංගලදේශය වැනි රටවල මේ ක්‍රමය යටතේ සිසුනට ණය පොලිය 5%කි. යාචකයින්ට 0%කි නිවාස වැඩි දියුණු කරගැනීම් සඳහා ඉතා අඩු පොලියකි. මේ ක්‍රමය ලංකාවේ ක්‍රියාත්මක වන්නේ 20% සිට 220% දක්වා වූ පොලියකිනි. බොහෝ ආයතන මහ බැංකුවේ ලියාපදිංචි වී නොමැත. යතුරු පැදි වලින් ග්‍රාමීය පෙදෙස් වල සැරි සරන නියෝජිතයින් බොහෝ විට කාන්තා පක්ෂය රවටා ගෙන තුන්දෙනාගේ කණ්ඩායම් වශයෙන් එකිනෙකා ඇපයට අත්සන් කර ණය ලබාදෙයි. කුඩා අකුරින් මුද්‍රිත පෝරම වලට අත්සන් ලබාගනී. බොහෝ පත්‍රිකා නිකුත් කර ඇත්තේ ඉංග්‍රිසි බසිනි. උගත් කමක් හෝ සාක්ෂරතාවයක් නොමැති අය මේ උගුලට හසුවේ. සැබවින්ම මෙය මානව බේදවාචකයකි. මුදල් වාරික ලබාගැනීමට පැමිණිමේදී තර්ජන කිරීම, බලෙන් මුදල් රැගෙනයාම බඩු බාහිරාදිය රැගෙනයාම, ලිංගික අල්ලස් ඉල්ලීම වැනි නීති විරෝධි බලපෑම් සිදුවේ. මේ නිසා සිදුවන කාන්තා හිංසනයට විරුද්ධව හඬක් නැගීමට සංවිධානයක් නොමැත. පීඩාවට පත් පිරිස බිය නිසා නීති මගට පිවිසීමක්ද සිදුනොවේ.

හිටපු මුදල් ලේකම්වරයෙකු වූ පී.ඩී. ජයසුන්දර මහතා මෙම ක්ෂුද්‍ර මුල්‍ය ණය ක්‍රමයට සමුපකාර ණයදෙන සමිති, සර්වෝදය, සමෘද්ධි සියළු ආයතන ඒකාබද්ධ කිරීමට සැලසුම් කරන ලදී. සමුපකාර ණයදෙන සමිති නියෝජනය කළ සමුපකාර ප්‍රසාදිනී වීරසූරිය මහතා ඊට බලවත් ලෙස විරුද්ධ විය. මුල්‍ය ආයතන හරිහැටි නියාමනය කිරීම මහ බැංකුවේ කාර්යයකි. ඊ.ටී.අයි, සක්විති, ගෝල්ඩන් කී, වැනි ආයතන කඩා වැටීමේ වගකීම පවතින්නේ මහ බැංකුවටය. නීතිඥ රාධිකා ගුණරත්න මහත්මිය මෙම ව්‍යාපාරයෙන් සිදුවී ඇති හානි පරීක්ෂා කිරීමට උතුර, උතුර මැද පළාත් වල සමීක්ෂණයක් කරන ලදී. ආචාර ධර්ම වලට පිටින් වැල් පොලිය ලබා ගැනීම. තර්ජන සහ හිංසා කිරීම පිළිබද පැමිණිලි ලැබුණි. නිල නොවන සියදිවි නසාගැනීමේ 160කට වැඩි බවට වාර්තාවේ. උතුරින් 59ක්ද, වව්නියාවෙන් 10, ඕමන්තේ අවු 3 ක දරුවෙකු සහිත මවක්ද දියසේන පුර සහ නව හරුගවින්ද දිවිනසාගැනීම් වාර්තාවේ. මියගිය අයට නඩු පවරා නැත. මෙවැනි සාහසික ක්‍රියාවන්ට එරෙහිව ග්‍රාමීය ජනතාව නැගී සිටිය යුතුය. කඩාවැටෙන ග්‍රාමීය ආර්ථිකය ආරක්ෂා කර ගැනීම අපගේ යුතුකමකි.

**යූ.ඩී.එස්. වීරසිංහ**
**නැ. ඇරැව්වල අංක 2 භාණ්ඩාගාරික සහ පර්ෂද ලේකම්**

# වාර්ෂික විනෝද සහ වන්දනා චාරිකාව

සී.ර. නැගෙනහිර ඇරැව්වල අංක 02 සණස සමිතිය වාර්ෂිකව පවත්වාගෙන යනු ලබන විනෝද සහ වන්දනා චාරිකාව දෙසැම්බර් 8,9, දෙනින තුල සාර්ථකව සිදුකරනු ලැබීය. මේ සඳහා ළමා සාමාජිකයන්ද ඇතුළු පනස් හතරදෙනෙකු සහභාගි වුහ. පොලොන්නරු ගල් විහාරය, සෝමාවතී පුදබිම, සේරුවාවිල, ත්‍රිකුණාමල යුධ කෞතුකාගාරය, උණුවතුර ළිං, වෙල්ගම් වෙහෙර, මාබල් බීච්, ආදී ස්ථාන සංචාරය කරන ලදී. මේ සඳහා සියළු වියදම් සමිතිය විසින් දරණ ලදී. විශේෂයෙන් ළමුන් සඳහා සංවිධානය කරන ලද ජලස්නාන වැඩසටහන පවතින අයහපත් කාලගුණික තත්වය නිසා, මුහුද සැඩපරුෂවීමෙන්ද, වැව් උතුරා වාන් දැමීමෙන්ද, අවලංගු කිරීමට සිදුවිය.



**යූ.ඩී.එස්. වීරසිංහ**
**වාර්තාකරු**

# වාර්ෂික අධ්‍යාපන චාරිකාව

තෙලවල සණස සමිතියේ වාර්ෂික අධ්‍යාපන චාරිකාව පසුගියදා සිදු කෙරිණි.

ප්‍රථම දින ත්‍රිකුණාමලයේ සිද්ධස්ථාන හා ඓතිහාසික ස්ථානවල සංචාරය කෙරිණි. තිරුකෝනේෂ්වරම් , ලංකාපටුන, වෙල්ගම්වෙහෙර, සේරුවිල, සෝමාවතිය, නිලාවැලි වෙරළ තීරය හා පර්ල් මුහුදු වෙරළ, කින්නියා පාලම ආදි ස්ථාන වල සංචාරය කළ අතර ත්‍රිකුණාමලය සණස කැම්පස් විශ්‍රාම ශාලාවෙහි නවාතැන් ලබාගත්හ.

දෙවන දින පොළොන්නරුව ගල්විහාරය, නිශ්ශංක ලතා මණ්ඩපය, ශිව දේවාලය හා නෙලුම් පොකුණ ආදි සිද්ධස්ථාන වැඳ පුදා ගත් පිරිස දිවා ආහාරයෙන් පසු ආපසු පැමිණීමෙන් මෙම සංචාරය සාර්ථකව නිමකල අතර,

සමිතියේ අධ්‍යාපන කමිටුව විසින් මෙම සංචාරය සංවිධානය කෙරිණි.

**තිළිණි ප්‍රනාන්දු**
**සී.ස. තෙලවල සණස වාර්තාකාරිනී**

# 20 වන සංවත්සර සැමරුම

ඇඹුල්ගම - නැගෙනහිර ජල්තර - හේනපිට සණස සමිතිය 1998-11-14 දින ආරම්භ වී 2018-11-14 දිනට සිය විසිනම වසර පසු කිරීම නිමිත්තෙන් එය අරුත්බරව සමරනු වස් සමිති සාමාජිකයින්ගෙන් ඔබ්බට ගොස් අවට ප්‍රදේශ සියල්ලම ආවරණය වන පරිදි විශාල ජනතාවකට විවිධ සේවාවන් රැසක් ඉටුකර දීමට අප සමිතියට හැකිවීම සම්බන්ධව නිහතමානීව සතුටුවේ,2ැෙ

තවද අප සමිතියේ ඉල්ලීම ඉවත නොදමා මෙම ප්‍රජා සත්කාර සේවා සියල්ල සම්බන්ධිකරණය කර දෙමින් සිය වටිනා කාලය සහ ශ්‍රමය අප වෙත ලබාදුන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැලුම් ප්‍රියන්කර මැතිතුමා සහ එතුමාගේ ඉල්ලීම පරිදි සිය විමද්‍යගත අරමුදලින් ප්‍රතිපාදන වෙන් කරමින් වෛද්‍ය කණ්ඩායම් සහ විවිධ සේවාවන් රැසක සේවාව අපවෙත ලබාදුන් ගරු පලාත්සභා මන්ත්‍රී නීතිඥ ජනක වැලිවත්ත මැතිතුමාගේ උපකාරය අගයමු.

එමෙන්ම ජල්තර-හේනපිට - ආටිගල යන ග්‍රාමසේවා වසම් හි ග්‍රාම සේවක මහත්ම මහත්මීන් ප්‍රදේශයේ ස්වෙච්ඡා සංවිධානවල සහ ව්‍යාපාරික හවතුන්ගෙන් ලැබුණු සහයද අගය කොට සලකමු. මේ සියල්ල සංවිධානය කර ගැනීම සඳහා ජල්තර මහා විද්‍යාලයීය භූමිය සහ ගොඩනැගිලි ලබාදෙමින් ගරු විදුහල්පති තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයද විශාල සහයෝගයක් අප වෙත ලබාදෙන ලදී මේ සියළු පිරිසගේ සහයෝගය මත මෙදින පැවති සේවාවන් අතර

දේශීය වෛද්‍ය සායනය, සුවනාරි සායනය, අක්ෂි වෛද්‍ය සායනය සහ ඇස් කණ්නාඩි බෙදාදීම, රැකියා පුහුණු වැඩසටහන්, බටහිර වෛද්‍ය සායනය, දන්ත වෛද්‍ය සායනය, ජාතික හැඳුනුම්පත් ජංගම සේවය, නීති ආධාර සේවාව, රැකියා පෙළ (යුධ හමුදා සහ තමත් ආයතන රැසක් සමගින්) යන අංගයන්ගෙන් සමන්විය විය.

හැඳුනුම්පත් ජංගම සේවාව ලබාගැනීමට පැමිණි අති විශාල සේවාදායකයින්ගේ තද බදය වැලැක්වීම සඳහා 40 ක පමණ කාර්ය මණ්ඩලයක් ඒ සඳහා යෙදවීමට සිදුවිය. වකුගඩු රෝග හදුනා ගැනීම, බරවා පරීක්ෂාව, ගැබ්ගෙල පිලිකා පරීක්ෂාව, දන්ත සායනය යන අංශ වෙතත් ජනතාව උනන්දුවෙන් සහභාගි වූ ආකාරයක් දිස්විය.

**එල්.පී. දර්ශණ ප්‍රදීප් කුමාට**
**කාරක සභික**

## කෘතගුණ සැලකීම උන්දුරුගොඩ දී

උන්දුරුගොඩ සමිතියේ නිර්මාතෘවරුන් සහ මියගිය සාමාජිකත්වය සිහිකිරීම වෙනුවෙන් වාර්ෂිකව සිදුකරන දානමය පිංකම මෙවරත් සමිති ශාලාවේදී පසුගියදා සිදුකරන ලදී.

සමිති සාමාජිකත්වය විශාල පිරිසක් සමගින් අවට සමිති සමුපකාරිකයින් මෙම මාහැගි පිංකම සඳහා සහභාගි වන ලදී.

**එම්. රොහාන් ජේ. පෙරේරා**
**වාර්තාව**

## නිදහසක් නැති නිදහස

| | |
|---|---|
| සමනළ රංචුවක් පියඹන | රටාවට |
| මදනල පහස විදිමින යයි | සොබාවට |
| පෙළ පෙළ බැදි පවුරු මග හැර | මනාවට |
| සිව්හෙළ කොහිද? නිදහස විඳ | රැකීමට |
| කාලය, ධනය, දේපල රැක ගෙන | මිනිහා |
| අභිමත පරිදි ගෞරවයක් ලැබු | මිනිහා |
| තීරණ ගැනීමට අයිතිය ඇති | මිනිහා |
| වෙළද පොළෙහි නැත නිදහස දැක | මිනිහා |
| අදහස් පැවසීම ගරුකොට | ඉල්ලීම |
| වෙනසක් කිරීමට අයිතිය නැති | කෙරුම |
| ප්‍රතිපත්තියක් තුළ මිනිහා | හැසිරීම |
| නිදහස උදුරගෙන පාලන බල | රැකුම |
| සිතට වහල් නොමවී සිතු දේ | ගන්ට |
| මතට තිත තබා නැත දිවි මග | යන්ට |
| ආරක්ෂාව පවුලේ ඇතිකර | ගන්ට |
| නිදහස නැහැ නීතියේ රැකවල | ගන්ට |
| රට හැම තැනම අයිතිය ඇති බව | කීවත් |
| පොලොවේ ඉඩක් නැත ඔප්පුවෙ පිටු | ලීවත් |
| දැනුමට, කුසලතාවට බුද්ධිය | තිබුවත් |
| නිදහස මරා ඇත නොතකා | මිනිහාවත් |
| ඉපදීමෙන් ලබන සිරුරේ | පැවතීම |
| නොදැනීමෙන් වෙදුන්, දොස්තර | වෙතදීම |
| දහමෙන් සඟුන්, පූජක තතු | පැහැදීම |
| විමසීමෙන් නොමැත නිදහස | ලැබදීම |
| අණ පනතින් ලියා තැබුමුත් කළ | යුතුදේ |
| දන මන පිනවනා පැතුමන් යට | කිම්දේ |
| කණකොක් හඩන හඩ දසඅත | රැව්පිළිදේ |
| සන තැබු කොලය නිදහස් සුළගේ | විහිදේ |

**පබැදුම - හේමසිරි බෙනරගම**

## දැයෙන් සමුගත් ආරම්භක නිලදරු



ඔහු නමින් ජේ.ඒ.ඩී. සරත් කුසුම්සිරි දියෙස් නම් වේ. 1990 දී නැ. ඉඳිබැද්දට ස.ණ.ස. සමිතියක අවශ්‍යතාව මැනවින් තේරුම්ගත් දියෙස් මහතා ඇතුළු කණ්ඩායම 1990 දී නැ. ඉඳිබැද්ද සණස ආරම්භ කරන ලද අතර එවකට එම මහතා සමිතියේ භාණ්ඩාගාරික ධුරය දරමින් නීත්‍යානුකූල සමිතියක් ලෙස පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු සකස් කිරීමට මූලික වු නිලධාරියෙකි. මෙතුමා 1991 සිට විවිධ නිලතල වලට පත්වී, ගුණාත්මක සේවාවක් ඉටුකර, දැයෙන් සමුගති.

**සමිතියේ සාමාජික සංවේගය පලකරමින් නිවන් සුව පතමු**

**කේ.ජී.ඩී. මුදිතා ප්‍රියදර්ශනී**

## මාසික තිළිණය

ස.ණ.ස. කොළඹ පුවත් මාසික ප්‍රශ්ණයට කූපනය මගින් ඔබ සපයන, නිවැරදි පිළිතුරට තිළිණයක් පිරිනැමීමට කටයුතු සම්පාදනය කර ඇති බව සතුටින් දන්වමු.

ඔබ ජයග්‍රහකයෙක් නම්, ඔබේ සමිතියේ හා පෞද්ගලික අනන්‍යතාවය තහවුරු කරවා එම තිළිණය දිසා සංගමයෙන් ලබාගන්න.

**සංස්කාරක මණ්ඩලය**

## කියවන්න... දැනුම ලබන්න....

### දෝතට තෑගි ගන්න ....

ඔබ කළ යුත්තේ මෙහි පළවන ප්‍රශ්ණයට පිළිතුර කූපනයේ පුරවා තැපැල් පතක අලවා සණස පුවත් කොළඹින් අංක 220/1, හයිලෙවල් පාර, වත්තේගෙදර, මහරගම වෙත 2019 මාර්තු 15 ට පෙර එවීමයි. ජයග්‍රාහකයින් රැසක් සිටියහොත් කුසපත් ඇදීමෙන් වාසනාවන්තයා තෝරා ගනු ලැබේ.

**ප්‍රශ්ණය :-** **ශ්‍රී ලංකාව යටත් විජිතයෙන් නිදහස ලබා 2019දී සමරන්නේ, කීවෙනි වසරද?**

## කුපන් තරගයේ ජයග්‍රහණය

**කූපන අංක 12**

**සී.ස. රාජගිරිය නැගෙනහිර සණස සමිතියේ ශාන්ත විජේසිංහ මහතා**

## කුපන් අංකය 02

මුලකුරු සමග නම: ........................................................................

ස්ථිර ලිපිනය: ........................................................................

........................................................................

දුරකථන අංකය: ........................................................................

පුරුදු අත්සන: ........................................................................

සණස සමිතියේ නම: ........................................................................

........................................................................

පිළිතුර: ........................................................................

........................................................................

## සංස්කාරක නිවේදනය

**පුවත්පතට, ඔබේ සියළුම ප්‍රබන්ධ හා ලිපි මෙන්ම ඡායාරූප ද සෑම මසකම පළමු සතිය තුළ සංගම් කාර්යාලයට ලැබීමට සලස්වන්න**

**සංස්කාරක මණ්ඩලය**

## තෙලවල සණස සමිතියේ සුමියුරු ළමා සමාජයේ අධ්‍යාපන චාරිකාව

තෙලවල සණස සමිතියට අනුබද්ධව සුමියුරු ළමා සමාජයේ වාර්ෂික අධ්‍යාපන චාරිකාව පසුගියදා සීතාවක උද්භිත උද්‍යානය, ඓතිහාසික වටිනාකමින් යුත් බුරැන්ඩි දේවාලය හා සීතාවක පැරණි රජමාළිගය, කුමාරි ඇල්ල ආදි ස්ථාන රැසක් නැරඹුහ.

තෙලවල සණස සමිතියේ කාන්තා කමිටුව විසින් මෙම චාරිකාව සංවිධානය කරන ලදී.

**බී. තිළිණි ප්‍රනාන්දු**
**තෙලවල වාර්තාකාරිනී**

# 2019 පත්වූ නව පර්ෂද නියෝජිතයින්

### මහරගම කලාපය

| | |
|---|---|
| කලාප අධ්‍යක්ෂක | එම්.ඒ.එස්. පෙරේරා |
| කලාප සභාපති | ප්‍රේමරත්න මනතුංග |
| කලාප උප සභාපති | රංජිත් ජයතිලක |
| කොට්ටාව පර්ෂදය | |
| පර්ෂද සභාපති | පී.ඒ. ආරියසේන |
| පර්ෂද උප සභාපති | ඩී.ඩී. ඇඹුල්දෙණිය |
| ලේකම් | බී. බටගොඩ |
| මහරගම පර්ෂදය | |
| පර්ෂද සභාපති | ශ්‍යාමලී කුමාරි |
| පර්ෂද උප සභාපති | නන්දසේන රාජපක්ෂ |
| ලේකම් | නයනා නිමාලී අබේසිංහ |
| පර්ෂද සම්. ලේකම් | නිලන්ති ධම්මිකා සුදසිංහ |

### දෙහිවල ගල්කිස්ස කලාපය

| | |
|---|---|
| කලාප අධ්‍යක්ෂක | ලලිත් පෙරේරා |
| කලාප සභාපති | මධුවන්ත පෙරේරා |
| කලාප උප සභාපති | ප්‍රසාද් විජේවර්ධන |
| දෙහිවල පර්ෂදය | |
| පර්ෂද සභාපති | චිත්‍රා පෙරේරා |
| පර්ෂද උප සභාපති | ඩී.ඒ. චන්ද්‍රපාල |
| ලේකම් | චාන්දනී විජේසේකර |
| ගල්කිස්ස පර්ෂදය | |
| පර්ෂද සභාපති | එච්.පී. කල්දේරා |
| පර්ෂද උප සභාපති | බී. තිලකචන්ද්‍ර පෙරේරා |
| ලේකම් | ජයන්ති වැලිකල |
| පර්ෂද සම්. ලේකම් | ජයනී රාජිකා |

### නුගේගොඩ කලාපය

| | |
|---|---|
| කලාප අධ්‍යක්ෂක | සුනිල් අබේසුන්දර |
| කලාප සභාපති | ජයන්ති රණසිංහ |
| කලාප උප සභාපති | එම්.කේ.ඩබ්. ඩයස් |
| රාජගිරිය පර්ෂදය | |
| පර්ෂද සභාපති | ඩික්සන් අත්තනායක |
| පර්ෂද උප සභාපති | ශාන්ත මල්ලවආරච්චි |
| ලේකම් | චන්දිමා දිල්රුක්ෂි |
| ජයවර්ධනපුර නුගේගොඩ පර්ෂදය | |
| පර්ෂද සභාපති | මල්ලිකා කුමාරප්පෙරුම |
| පර්ෂද උප සභාපති | පද්මකුමාර පෙරේරා |
| ලේකම් | පත්වී නැත |
| පර්ෂද සම්. ලේකම් | රෝහිණී ඩයස් අබේසිංහ |

### කොළඹ කලාපය

| | |
|---|---|
| කලාප අධ්‍යක්ෂක | යසසිරි අමරසිංහ |
| කලාප සභාපති | එල්.බී. දයානන්ද |
| කලාප උප සභාපති | සෝමදාස මෙතායස් |
| කොළඹ උතුර | |
| පර්ෂද සභාපති | ජසින්තා පෙරේරා |
| පර්ෂද උප සභාපති | කේ. වන්නි ආරච්චි |
| පර්ෂද ලේකම් | එච්.ඩී. ජයන්ති චන්ද්‍රලතා |
| කොළඹ දකුණ පර්ෂදය | |
| පර්ෂද සභාපති | කාන්තිනී පෙරේරා |
| පර්ෂද උප සභාපති | මංගලිකා උඩවත්ත |
| පර්ෂද ලේකම් | කේ. පියසීලි |
| පර්ෂද සම්. ලේකම් | රත්නසිරි කොළඹගේ |

### මොරටුව කලාපය

| | |
|---|---|
| කලාප අධ්‍යක්ෂ | සුනිල් ප්‍රියලාල් |
| කලාප සභාපති | දර්ශන දේශප්‍රිය |
| කලාප උප සභාපති | එස්. රත්නසිරි |
| කටුබැද්ද පර්ෂදය | |
| පර්ෂද සභාපති | එච්.සී. ජිනදාස |
| පර්ෂද උප සභාපති | සුදත් ගුණවර්ධන |
| ලේකම් | පද්මා ගල්හේන |
| පර්ෂද සම්. ලේකම් | දිස්නා දර්ශනි දාබරේ |
| එගොඩ උයන පර්ෂදය | |
| පර්ෂද සභාපති | එච්. අතුල පෙරේරා |
| පර්ෂද උප සභාපති | විනිප්‍රීඩා මල්කාන්ති |
| ලේකම් | ටෙක්ලා ශාන්ති සිල්වා |
| පර්ෂද සම්. ලේකම් | සකුති උපහරා ප්‍රනාන්දු |

### කැස්බෑව කලාපය

| | |
|---|---|
| කලාප අධ්‍යක්ෂ | සී. ගමගේ |
| කලාප සභාපති | එම්.එම්. චන්දුල දසනායක |
| උප සභාපති | වී.එම්. කපිල ජයන්ත |
| මකුළුදූව පර්ෂදය | |
| සභාපති | එච්.පී. රත්නසිරි කල්දේරා |
| උප සභාපති | එච්.එම්. අමරසේකර |
| ලේකම් | යූ.ඩී.එස්. වීරසිංහ |
| මාකන්දන පර්ෂදය | |
| සභාපති | ෂෙල්ටන් සේනාරත්න |
| උප සභාපති | පී.ඩී. රම්‍යා ප්‍රියන්ති |
| ලේකම් | රානි වීරසිංහ |
| මාම්පේ පර්ෂදය | |
| සභාපති | ඩී.ඩී.කේ. චන්ද්‍රලතා |
| උප සභාපති | චමිලා දමයන්ති |
| ලේකම් | චතුරංගනී ජයසිංහ |
| බොරලැස්ගමුව පර්ෂදය | |
| සභාපති | ඩබ්.ඩී. ශිරානි |
| උප සභාපති | ආර්.ඩී.පී. රණසිංහ |
| ලේකම් | සුමනලතා වනසිංහ |

### හංවැල්ල කලාපය

| | |
|---|---|
| කලාප අධ්‍යක්ෂක | ජී.ඩී. කරුණාරත්න |
| කලාප සභාපති | ඩබ්.එල්.සී.ද. අල්විස් |
| කලාප උප සභාපති | කේ.ඒ. පියතිලක |
| සීතාවක පර්ෂදය | |
| සභාපති | කේ.පී. යසපාල |
| උප සභාපති | ඩබ්.ටී. ප්‍රියංගිකා |
| ලේකම් | ගීතා නන්දසීලි |
| කොස්ගම පර්ෂදය | |
| සභාපති | සුනිල් නවරත්න |
| උප සභාපති | අජන්ත හේරත් |
| ලේකම් | කේ.ඒ. මාලනි ප්‍රේමලතා |
| හංවැල්ල පර්ෂදය | |
| සභාපති | ඩී.ඒ.ඩී. ජයසේකර දංගල්ල |
| උප සභාපති | එම්.ඩබ්. සෝමසේන |
| ලේකම් | ඩබ්.එල්.ඩී. කරුණාරත්න |
| කලාප අනුශාසක | ටී. විජේවර්ධන |
| පර්ෂද සම්. ලේකම් | දිස්නා කළුබෝවිල |

### පාදුක්ක කලාපය

| | |
|---|---|
| කලාප අධ්‍යක්ෂ | මෙත්සිරි ජයකොඩි |
| කලාප සභාපති | ඩී.එම්. හේමපාල |
| කලාප උප සභාපති | සී.පී. බාලසූරිය |
| වග පර්ෂදය | |
| සභාපති | ලලිත් රම්‍යසිරි |
| උප සභාපති | ඒ. සිරිසෝම |
| ලේකම් | නිමල් කාන්තිරත්න |
| බෝපෙ පර්ෂදය | |
| සභාපති | ජී. උපාලි තිස්ස |
| උප සභාපති | ඉන්දික ලක්මාල් |
| ලේකම් | ජීවා නිල්මිණී |
| පර්ෂද සම්. ලේකම් | ප්‍රියදර්ශී මාඹුලගේ |

### කඩුවෙල කලාපය

| | |
|---|---|
| කලාප අධ්‍යක්ෂ | සරත් පෙරේරා |
| සභාපති | සුදත් පුෂ්පකුමාර |
| උප සභාපති | ගුණපාල සේනාරත්න |
| අතුරුගිරිය පර්ෂදය | |
| සභාපති | ඒ.ඒ. කමල් කිත්සිරි |
| උප සභාපති | ආර්.ඒ. ශ්‍රියානි මාලා |
| ලේකම් | එච්.ඒ. ශ්‍රියානි ගුණවර්ධන |
| නවගමුව පර්ෂදය | |
| සභාපති | කේ.කේ. ඉන්ද්‍රපාල |
| උප සභාපති | නිහාල් පියතිස්ස |
| ලේකම් | ඩබ්.ඩී. ගුණදාස |
| බත්තරමුල්ල පර්ෂදය | |
| සභාපති | සන්ධ්‍යා කානායක්කාර |
| උප සභාපති | ලසන්ත මල්වරආරච්චි |
| ලේකම් | අනෝමා දුණුවිල |
| හෝකන්දර පර්ෂදය | |
| සභාපති | කේ.ඩී. කරුනාරත්න |
| උප සභාපති | ඥානරත්න වේරගල |
| ලේකම් | කේ.එල්. අනුලා |
| පර්ෂද සම්. ලේකම් | නිල්මිණි චන්ද්‍රිකා ඩයස් |

### කොලොන්නාව කලාපය

| | |
|---|---|
| කලාප අධ්‍යක්ෂක | ඒ.ඩී. ආරියපාල |
| කලාප සභාපති | රනිල් සූරියආරච්චි |
| උප සභාපති | සුජාතා වික්‍රම |
| මුල්ලේරියාව පර්ෂදය | |
| සභාපති | ප්‍රියන්ත කහපල ආරච්චි |
| උප සභාපති | හසිත නානායක්කාර |
| ලේකම් | ඩබ්. අනුරාධා |
| කොටුවිල පර්ෂදය | |
| පර්ෂද සභාපති | සුසන්තා කුමාරි |
| උප සභාපති | ඊ.එම්.ඒ. ද සේරම් |
| ලේකම් | රමණී පෙරේරා |

### හෝමාගම කලාපය

| | |
|---|---|
| කලාප අධ්‍යක්ෂක | කුමාර ප්‍රසන්න ගීකියනගේ |
| කලාප සභාපති | යූ. ආනන්ද |
| කලාප උප සභාපති | නිමල් වන්නිආරච්චි |
| හෝමාගම පර්ෂදය | |
| සභාපති | රණසිංහ අතුකෝරළ |
| පර්ෂද උප සභාපති | ඊ.ඒ.ඩී. ලයනල් රත්නසිරි |
| ලේකම් | කේ.ඒ.ඩබ්. අමරසේන |
| ඕවිටිගම පර්ෂදය | |
| සභාපති | ජයන්ත පුස්සැල්ල |
| උප සභාපති | කේ. සරත් කුමාර |
| ලේකම් | ඒ පත්මසිරි |
| පිටිපන පර්ෂදය | |
| සභාපති | එච්. මල්ලිකා |
| උප සභාපති | ජයතුංග වෙලගෙදර |
| ලේකම් | එස්.එල්.එම්. නන්දනි |
| පර්ෂද සම්. ලේකම් | කුමුදිනී |
| හබරකඩ පර්ෂදය | |
| සභාපති | එම්.ඩී. සෝමවති |
| උප සභාපති | ජයවති තුඩුහේන |
| ලේකම් | රේණුකා දමයන්ති |
| මත්තෙගොඩ පර්ෂදය | |
| සභාපති | මාලනී පිරිස් |
| උප සභාපති | ඩබ්. නන්දසේන |
| ලේකම් | එච්.ඒ.පි. මධුරප්පේරුම |
| දියගම පර්ෂදය | |
| සභාපති | සුසිලා අමරසිංහ |
| උපසභාපති | ජේමසිරි විරසූරිය |
| පර්ෂද ලේකම් | විනීතා ජයසිංහ |
| පර්ෂද සම්. ලේකම් | නිර්මදා ජනාදරි |

ස.ණ.ස.
පුවත් කොළඹින්



# නිදහසේ මතකයන්...

ආහාරයේ වැදගත් කම දැනෙන්නේ කුසගින්නේ සිටින අයටයි. වතුර පොදක වටිනාකම වඩාත්ම දැනෙන්නේ පිපාසාවෙන් පෙලෙන පුද්ගලයාටයි. නිදහස නමැති අකුරු සතරේ නියම අරුත දැනෙන්නේ සිර මැදිරියේ යකඩ කූරු අතර දුක් විදින සිරිකරුවාටයි කිසියම් ඉඩක් ලද විගස සිරි මැදිරියෙන් පලායන්නේ එළිමහනේ විදිනා සුවය ඔහු අත් විඳ ඇති නිසාය. ශ්‍රී ලංකාවාසීන්වූ අපටත් ක්‍රි.ව. 1796 වන විට නිදහසේ අගය දැනෙන්නට වුයේ විදේශිකයන් මාරුවෙන් මාරුවට ගිවිසුම් අත්සන් කිරීමෙන් පසුවය. ලන්දේසින් සතුසියළු ප්‍රදේශ බ්‍රිතාන්‍යයන්ට අයිතිවිය. පාලනය සඳහා ඉංග්‍රීසි ආණ්ඩුකාරවරුන් පත්කෙරින. ඔවුන් 1802 ජුලි මාසයේදී උඩරට ආක්‍රමනය කරන ලදී. එහෙත් නිසි සැලසුමක් නොමැති නිසා එම වෑයම අඩාල වූහ. නායක්කර් වාංශික ශ්‍රී වික්‍රම රාජසිංහ රජු සමග උඩරට සිංහල ප්‍රධානීහු විරසක වීම නිසා දෙපිරිස දැඩිසේ වෛරයට පත්වූහ. නමුත් ඇහෙලේපොළ ප්‍රමුඛ සිංහල නායකයන් පිරිසක් බ්‍රිතාන්‍යයට පක්ෂ පාතී වු අතර රජු අල්වා ගන්නා ලදී. උඩරට සිංහල ප්‍රධානීන් හා ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා අතර 1815 මාර්තු 02 වන දින අත්සන් කරන ලද උඩරට ගිවිසුමෙන් අපේ රට බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ කොළණියක් බවට පත්විය. එතැන් සිට සිංහලයා එකමුතු ජාතියක් ලෙස පෙරමුනට ගෙන ඒමට වීරයන් සහ වීරවරියන් රැසක්ම පෙරමුණට පැමිණියෝය.

1818 දී වෙල්ලස්ස කැරැල්ල නමින් ප්‍රථම නිදහස් අරගලයට උරදුන් කැප්පෙට්ටිපොල, වෙල්ලස්සේ උපතලද කිවුලේ ගෙදර මොහොට්ටාල, බූ ටාවේ රටේ රාළ, පුරන් අප්පු, කුඩහපොළ හිමියන් එක්ව අසාධාරන වු බදු පැනවීම් වලට එරෙහිව අරගලයක් ආරම්භ කරනලදී. මෙහිදී බ්‍රිතාන්‍ය පාලකයන් ඉතාමත් කෲර ලෙස ජනයා පෙළමින්, ඝාතනය කරමින් එම වකවානුව පවා දෙන්නන්ගේ සහ කුමන්ත්‍රණකරුවන්ගේ පාරාදීසයක් බවට රටම පත් කරගන්නා ලදී. 1860 ජුනි 04 වන දින අපේ රටේ ප්‍රථම සිංහල පුවත්පත වන "ලංකා ලෝකය" ආරම්භ කල නිසා පොදු ජනතාවට රටේ ඇත්ත තත්වය නියමාකාරයෙන් දැන ගන්නට ලැබුනා. ඕල්කට්තුමා ලංකාවට පැමිනීමත් සමගම සිංහල බොදු ජනතාවට මේ ගැන ආඩම්බරයක් ඇතිවින.

ශ්‍රීමත් රාමනාදන් තුමා, ශ්‍රීමත් අරුනාචලම්තුමා වැනි අන්‍ය ජාතීන්ද එක්වීම අපේ වාසනාවට සිදුවීමකි. ආර්.ජී. සේනානායක, ඒ.ඊ. ගුනසිංහ, ඩී.බී. ජයතිලක අයගේද සහායද අගය කළ යුතුය. 1931 දී සර්ව ජන ඡන්ද බලය ලැබීමෙන් පසු 1948 පෙබරවාරි 4 වනදා අපට නිදහස ලැබින. ලේ බිඳක් හෝ නොසොල්වා, බන්දේසියක තබා පිරිනමා නිදහස අපට ලැබුනායයි සමහරුන් පුරසාරම් දෙඩුවත්, ආපසු හැරී සිංහාවලෝකනයෙන් බැලීමේදී පෙනී යන්නේ කොයිතරම් රණකාමි, නිර්භීත පිරිසක් අපේ මේ නිදහස් අරගලයේදී රට වෙනුවෙන් දිවිපුද කර ඇද්ද යන්නයි.

"මේ නිදහස් දිනයේදී, හිස නමා අප ඔවුනට ගෞරවය පුද කරමු"

**ලක්ෂ්මන් ගුණවර්ධන**
**පිටිපන නගරය සණස වාර්තාකරු**

# නව වසරට ඔබ සුදානම්ද?

2019 නව වසර ගැන ඔබ කුමක් සිතුවාද?

ඔබට නිමා කර ගැනීමට අතපසු වු වැඩ කොටසක් තිබුනාද? කොහොම හරි මම මේ අවුරුද්දේ ඒ දේ කරනවා යැයි ධනාත්මකව සිතන්න පුරුදුවන්න. යම් ඉලක්කයක් මත වැඩ කිරීමට පටන් ගන්න. පාසල් යන දරුවන්ටද ඉලක්කයක් මත පාඩම් වැඩවල යෙදෙනවානම් ඔබ බලාපොරොත්තු වන තැනට ලඟාවිමට පහසු වනු ඇත.

ඔබ පසුගිය වසර ගැන පසුතැවිලි නොවන්න. විය යුත්තේ අවස්ථාව තිබියදීත් ඔබ නොකල දේ ගැනයි. සාර්ථක වී සිටින බොහෝ දෙනෙක් අසාර්ථක උත්සාහයන් තුල යෙදුනු අයයි. එම නිසා මේ වසරේදී අනවශ්‍ය වියදම් කපා හරින්න. කෑම බීම පවා අප කනවාට කුණු බාල්දිය පුරවනවා. එය අඩු කර ගන්නට උත්සාහ ගන්න.

තමා අතින් පසුගිය අවුරුද්දේ ගිලිහී ගිය සිතිවිලි සාරධර්ම වැඩි දියුණු කර ගැනීමට උත්සුක වන්න. දරුවන්ටද යහපත ගැන කියාදෙමින් තමාටද යහපතක්ම කරගන්නට සියළු දෙනාගේම සිත පැහැදේවායි නව වසරේ මගේ පැතුමයි.

**සන්ධ්‍යා ජයකොඩි**
**පිටිපන නගරය සණස**

01 පිටුවෙන්

## සමුපකාර අරමුදල නිලධාරීන්ගේ බුදලයක්ද?

ප්‍රබෝධාත්මක අත්දැකීම් ලබා ගැනීම සඳහා රුපියල් ලක්ෂ 27කට වැඩි මුදලක් වැය කර ඇත.

අධ්‍යාපන හා පරිගණක පුහුණුවට දරා ඇති ලක්ෂ 124ක පමණ මුදල දරා ඇත්තේ නිලධාරීන් වෙනුවෙනි. ඔවුන් සඳහා දෙපාර්තමේන්තුවේ වියදම් ශීර්ෂ වලින් දැරිය යුතුය. සණස සමිතිවල කිසිවෙකුට පරිගණක පුහුණුවක් නම් ලබා දී නැත.

විශ්‍රාම වැටුප් ඒකකය සඳහා දරා ඇති ලක්ෂ 121 ට වැඩි, හා සමාලෝචන මණ්ඩල දීමනාව හා ස්ථාවර වත්කම් මිලදී ගැනීමට මෙම අරමුදලින් වියදම් දැරීම පවතින රීතියේ විධානවලට පටහැනිය.

මෙම අරමුදලේ මුදල් සිය අභිමතයන් පරිදි මෙතෙක් කල් දරා ඇතත් නිසි විගණනයට ලක් කර ඇති බවක් ද දක්නට නැත. සමුපකාර සමිතිවල අරමුදල් නිසිලෙස වැය කිරීම පිලිබඳව මගපෙන්වන, පරීක්ෂා කරන බලය ඇති නිලධාරීන් ලජ්ජා විය යුත්තේ මෙම අරමුදලේ ගිණුම් නිතීරීතිවලට යටත්ව වියදම් නොකිරීම ගැනය. එසේ කරමින් අන් අයට උපදෙස් දීම කොපමණ දුරට සදාචාර සම්පන්නද?

01 පිටුවෙන්

## උපහාරයෙන් පිදුම් ලබයි

මේ සඳහා හෝමාගම කලාපයේ අධ්‍යක්ෂතුමා ඇතුළු සියළුම සමිතිවල සභාපතිවරුන් හා කාරකසභික මහත්ම මහත්මීන් සහභාගි වු අතර සී.ස. කොළඹ දිස්ත්‍රික් සණස සංගමයේ සභාපතිතුමා සමගින් එම මැතිනිය මේ අවස්ථාව සඳහා සහභාගි වූහ.

කොළඹ දිස්ත්‍රික් සණස සංගමයේ ගරු සභාපති ඩී. වීරසූරිය මහතා පැමින සිටි පිරිස අමතමින් ඔහු විසින් සණස සමිති සඳහා සිදුකරන අවංක හා කැපවීමෙන් කටයුතු කිරීම සියළු සමිතිවල නායකයින් විසින් සිදුකිරීම තමාට සිදුකරන හොදම උපහාරය බවත් පවසන ලදී.

**ප්‍රියංගා කුමුදිනි**
**හෝමාගම පර්ශද සම්බන්ධීකරන ලේකම්**

## ජාතක කතා පොතෙන්
# ආරාම දූසක ජාතකය

| | |
|---|---|
| පෙර බරණැස් | නුවර |
| රජෙකු වී, විශ්වසේන නම් | පවර |
| මාළිග උයන් | මෙහෙවර |
| උයන්පල්ලා සතුය අණ | වර |
| නෙත්කළුය ලදළු මල් | ඉති |
| සිත් ගතිය පිපුණු මල් | පෙති |
| තෙත් බරිත දෙරණ තණ | පෙති |
| වත් පිරිය, දසුන | පැහැයුති |
| උත්සවයක් නිසා | වෙති |
| උයන්පල්ලා නික් | මෙති |
| පවරමින් වැඩ | නිති |
| උයනෙ වඳුරන් වැඩ | බාරගති |
| සමින් සැදි කළ | ගොන්න |
| එකින් එක පුර | මින්න |
| සැනෙන් ජල ගෙන | එන්න |
| ඉසින් මල් පැල | ලියලන්න |
| දිනක් නායක | වඳුරු |
| අනක් දෙති, මල් | පඳුරු |
| සැකක් හැර මුල් | පොකුරු |
| දිගක් මැන හල | වතුරු |
| වඳුරු රැළ | දිනපතා |
| ගලවමින් මැන | යොතා |
| දිග කොටද මුල් | ඉතා |
| බලන සඳ! | බෝසතා |
| අනුවණ කමින් | යුත් |
| වඳුරු රැළ | නොමනත් |
| නුසුදුසුය නායක | මුත් |
| පැහැදිලි කළේ | බෝසත් |

*උපදේශය: නුසුදුස්සන් නිලයෙහි යොදවන ප්‍රධානියා වරදකරුවෙකි*

*-සිරි-*

## සුභ උපන්දිනයක් වේවා !!

**කරගම්පිටිය සමිතියේ පසුගිය මස උපන් දිනය සැමරූ අය**


නෝරා ද සිල්වා


එච්. පෙරේරා


කේ.එච්.ජී. ප්‍රනාන්දු


වයි.එස්. පෙරේරා


ශාන්තිලතා


වයි. දාබරේ


නීටා රමණි


සෝමා දාබරේ


එස්.ඒ. මෙරි


එම්. සිල්වා


එල්. මනෝරි


එච්. නිලන්ති


ඒ.එච්. චන්ද්‍රවති


කේ.කේ. ජයවීර


කේ. වර්ණකුල


කේ. ප්‍රනාන්දු


එල්. පෙරේරා


සී. සමන්ති


නර්මදා සදුනි

# 35 වන සංවත්සරය

## සීමාසහිත ශ්‍රී ජයවර්ධනපුර නුගේගොඩ ස.ණ.ස. සමිතිය

ශ්‍රී ජයවර්ධනපුර නුගේගොඩ ස.ණ.ස. සමිතිය අභිමානවත් 35 වන සංවත්සර උත්සවය 2019 පෙබරවාරි මස 04 වන දින කොළඹ දිස්ත්‍රික් ස.ණ.ස. සමිති සංගමයේ ගරු සභාපති ඩැනිසන් වීරසූරිය මහතාගේ සහභාගීත්වයෙන් නාවල ශ්‍රී වික්‍රමසිංහාරාම විහාරස්ථ ධර්ම ශාලාවේදී අති උත්කර්ෂවත් අයුරින් පැවැත්වේ.

**කේ.ඒ. නිෂානි දීප්ති පෙරේරා**
**ගරු ලේකම්**




### ගරු අධ්‍යක්ෂක මණ්ඩලය

එම්. කමිල වත්සල ඩයස් මහතා - ගරු සභාපති
කේ.පී.පී. දයාකාන්ති මහත්මිය - ගරු උප සභාපති
කේ.ඒ. නිෂානි දීප්ති පෙරේරා මහත්මිය - ගරු ලේකම්
එම්. චන්ද්‍රිකා ඩයස් මහත්මිය - ගරු භාණ්ඩාගාරික
අනූෂා කල්දේරා මහත්මිය - ගරු අධ්‍යක්ෂක
කේ.පී. දේවිකා සෞම්‍යා සේපාලි මහත්මිය - ගරු අධ්‍යක්ෂක
නිලුක ප්‍රභාත් රාජපක්ෂ මහතා - ගරු අධ්‍යක්ෂක
එම්.කේ. චිත්‍රානි පෙරේරා මහත්මිය - ගරු අධ්‍යක්ෂක
කුමාරි සුදර්ශනී ගුණවර්ධන මහත්මිය - ගරු අධ්‍යක්ෂක

### සංවර්ධන හා අධ්‍යාපන අනුකමිටුව

එම්. කමිල වත්සල ඩයස් මහතා - ගරු සභාපති
කේ.පී.පී. දයාකාන්ති මහත්මිය - අනකමිටු සභාපති
කේ.ඒ. නිෂානි දීප්ති පෙරේරා මහත්මිය - අනකමිටු උප සභාපති
කේ.පී. දේවිකා සෞම්‍යා සේපාලි මහත්මිය - අනුකමිටු ලේකම්
පසන් සුපුන් රංගන මහතා - අනුකමිටු සාමාජික
කුෂාන් සමීර විතානගේ මහතා - අනුකමිටු සාමාජික







### ගරු විගණන කමිටුව

ඩබ්. කුමාර චන්දන ජයතිස්ස මහතා - විගණන කමිටු ලේකම්

එම්.කේ. කුසුමා රංජනී පෙරේරා මහත්මිය - කමිටු සාමාජික

එස්. ආශා ශ්‍යාමලී හේමචන්ද්‍ර මහත්මිය - කමිටු සාමාජික







### බැංකු කාර්ය මණ්ඩලය

අෂිනි මධුෂිකා සංජීවනී වීරකෝන් මෙනවිය - කළමණාකරණ සහකාර

එච්.ඩී. බියට්‍රිස් රූපසිංහ මහත්මිය - ප්‍රධාන කළමණාකරු

එම්. කමිල වත්සල ඩයස් මහතා - ගරු සභාපති

මහේෂා නිර්මාලි වික්‍රමආරච්චි මෙනවිය - සහකාර කළමණාකරු

හේෂානි ක්‍රිෂාන්ති කුමුදුමාලි මෙනවිය - කළමණාකරණ සහකාර







